ලංකාදීප
# මැදරට
★★★
2022 මාර්තු මස 13 වැනිදා ඉරිදා

## මත්ද්‍රව්‍ය සමග සිරිපා වඳින්න ගිය 250 ක් පොලිස් දැලේ

(හැටන් සුදත් එච්.එම්. හේවා)

ශ්‍රී පාද වන්දනා සමය ආරම්භ වී ගත වූ දින 75ක කාලය තුළ දී විවිධ මත්ද්‍රව්‍ය රැගෙන ශ්‍රීපාදය වන්දනා කිරීමට පැමිණි පුද්ගලයන් 250 ක් අත්අඩංගුවට ගෙන ඇති බව හැටන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි විජිත ද අල්විස් මහතා පවසයි.

මේ පිළිබඳව වැඩි දුරටත් කරුණු දැක්වූ විජිත ද අල්විස් මහතා පැවසුවේ, හැටන් කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් පොලිස් නිල සුනඛ ස්ටවුඩ්ගේ සහාය මත මෙසේ මත් ද්‍රව්‍ය රැගෙන ශ්‍රීපාදය වන්දනා කිරීමට පැමිණි මෙම පිරිස් අත්අඩංගුවට ගෙන ඇති බවය.

විවිධ මත් ද්‍රව්‍ය රැගෙන ශ්‍රීපාදය වන්දනා කිරීමට පැමිණ අත්අඩංගුවට ගත් පිරිසෙන් වැඩිම පිරිසක් වයස අවුරුදු 20ත් 35ත් අතර තරුණ පිරිස බවත්, මෙම තරුණ පිරිස් මෙසේ විවිධ මත්ද්‍රව්‍ය පානයට යොමු වීම කනගාටුවට කරුණක් බව ද ඒ මහතා පවසයි.



## බ්‍රන්ස්වික් වතුයායේ කම්කරුවන්ටත් වතුර නෑ

(මස්කෙළිය ගාමිණී බණ්ඩාර ඉලංගන්තිලක)

මස්කෙළිය වැවිලි සමාගමට අයත්, බ්‍රන්ස්වික් තේ වතුයායේ, බ්‍රන්ස්වික් කොටසේ වතු කම්කරු පවුල් 200 කට පමණ උග්‍ර පානීය ජල ගැටලුවක් පවතින නිසා ඒ ජනතාව දැඩි පීඩාවකට පත්ව සිටිති.

මෙම වතුයායේ කම්කරු ජනතාව සඳහා උල්පත් ජලය භාවිත කරමින් නළ මාර්ගයෙන් පානීය ජලය සපයා ඇත්තේ වතු පාලනාධිකාරිය මගිනි. මේ දිනවල පවතින දැඩි වියළි කාලගුණික තත්වයත් සමග ඒ ජල මූලාශ්‍ර සිඳී යාම නිසා වතු පාලනාධිකාරිය ට්‍රැක්ටර් යොදවා දිනකට ජලය එක් වරක් පමණක් සම්පාදනය කළ ද එය කිසිසේත් ප්‍රමාණවත් නොවන බව වතු කම්කරුවෝ පැවසූහ.

පානීය ජල ප්‍රශ්නය හේතුවෙන් නියමිත වේලාවට දෛනික සේවා කටයුතු සඳහා වාර්තා කිරීමට නොහැකි වී ඇති බව පෙන්වා දෙන මෙම වතු කම්කරුවෝ, පාසල් වයසේ තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ද අඩාළ වී ඇති බව පෙන්වා දෙති.

# රටේ ප්‍රශ්න ඔඩුදුවන්නේ දියවන්නාව පැත්තේ අයගේ මානසික සෞඛ්‍ය පිරිහීමෙන්

## කරන වාද විවාදවලින් ඔවුන්ගේ මානසික සෞඛ්‍ය තියෙන්නේ කොතැනකද කියා තේරුම් ගන්න පුළුවන්

### ජ්‍යෙෂ්ඨ මනෝ වෛද්‍ය විශේෂඥ වික්‍රමසිංහ හෙළිකරයි



(පේරාදෙණිය අරවින්ද හාගහඇල්ල)

**දියවන්නාව පැත්තේ මානසික සෞඛ්‍ය යහපත් මට්ටමක නැති නිසා අද රටේ ප්‍රශ්න ගොඩක් වැඩිවී තිබෙන බව ජ්‍යෙෂ්ඨ මනෝ වෛද්‍ය විශේෂඥ ඩබ්ලිව්.ඒ.එල්. වික්‍රමසිංහ මහතා අනාවරණය කරයි.**

මෙරට ජනගහනයෙන් 12 % කට ප්‍රතිකාර ලබාගත යුතු මට්ටමේ කුමන හෝ මානසික අබාධයක් තිබෙන බව මෙයට වසර ගණනාවකට පෙර සිදුකළ සංගණනයක දී හෙළි වූ බවත් වර්තමානය වනවිට ඒ අගය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබෙන බවට අනුමාන කළ හැකි බවත් වෛද්‍යවරයා කියයි.

මානසික සෞඛ්‍ය පිළිබඳව 2007 වසරේ දී විධිමත් සංගණනයක් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් කළ බවත්, ඉන්පසු එවැනි සංගණනයක් මෙතෙක් කර නොමැති බවත් ඒ මහතා කියයි.

**"සුලබ මානසික ආබාධ" නමැති තම ග්‍රන්ථය එළිදැක්වීම නිමිත්තෙන් මහනුවර ජාතික රෝහලේ දී පැවැති උත්සවයක දී එසේ කී මනෝ වෛද්‍ය විශේෂඥ වික්‍රමසිංහ මහතා මෙසේ ද පැවසුවේය.**

සමාජයේ සුලබව දක්නට ලැබෙන මානසික ආබාධ තත්ත්වය විෂාදයයි. 2007 වසරේ දී කළ සංගණනයට අනුව ජනගහනයෙන් 6.7% ක් මෙම රෝග තත්ත්වයෙන් පෙළෙන බව හෙළි වුණා. අද ජනතාව නොයෙක් ආකාරයෙන් පීඩාවට පත්වෙලා. පාසල් දරුවන් වුණත් එහෙමයි. මේ නිසා බරපතළ ලෙස ආතතිය, විෂාදය වැනි තත්ත්වයන් පුද්ගලයන් තුළ මතුවෙනවා. ප්‍රතිකාර ලබාගත යුතු මානසික ආබාධ සහිත පුද්ගලයන් සැලකිය යුතු පිරිසක් ප්‍රතිකාර නොගෙන සිටීම බරපතළ තත්ත්වයක්.

මානසික ආබාධ සහිත පුද්ගලයන් ප්‍රතිකාර ගැනීමට පැමිණෙන ආකාර දෙකක් තිබෙනවා. තමන් විසින්ම ප්‍රතිකාර සඳහා යොමුවිය යුතු යැයි සිතන අය ඉන්නවා. ඒ වගේම වෙනත් අයකු විසින් ප්‍රතිකාර සඳහා යොමු කරන අයත් ඉන්නවා. මේ අතර මානසික ආබාධ තත්ත්වයක් තිබිය දී තමන්ට එවැන්නක් තිබෙන බව නොදැන හෝ පිළිනොගෙන ප්‍රතිකාරවලට යොමුනොවන පිරිසකුත් ඉන්නවා.

මොළයක් තිබෙන ඕනෑම අයෙකුට මානසික ආබාධයක් ඇතිවිය හැකිය. මොළයේ ඇති රසායනික ද්‍රව්‍යයක අංශුමාත්‍ර වෙනසකින් කෙනෙකු මානසික ආබාධ තත්ත්වයට පත්වීමට පුළුවන්. මේ නිසා මානසික රෝගයකට ප්‍රතිකාර ගැනීම සඳහා යොමුවීම කිසිදු අවශ්‍යතාවක අවමානයක් ලෙස සලකන්න හොඳ නැහැ. මෙවැනි අය ලෙස වෙනස්කිසින් නොබැලීමට සමාජය ද පුරුදු විය යුතුයි.

සංවර්ධනයේ ප්‍රධාන අංගයක් තමයි සෞඛ්‍යය. ජනතාව සෞඛ්‍යමත් නැතිනම් ඒ රටට සංවර්ධනයක් ගේන්න බැහැ. එහිදී මානසික සෞඛ්‍ය ඉතාම වැදගත්. ආර්ථික අතින් බැලුවත් දේශපාලනික අතින් බැලුවත් මානසික සෞඛ්‍ය වැදගත් කියන එක අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. දියවන්නාව පැත්තේ මානසික සෞඛ්‍ය යහපත් මට්ටමක නැති නිසා අද රටේ ප්‍රශ්න ගොඩක් වැඩිවෙලා. රටේ මිනිස්සුන්ගේ යහපතට හේතු වන කාරණා පැත්තකට දලා වාද විවාද කරන අයුරු දැක්කම ඒ අයගේ මානසික සෞඛ්‍ය කොතන ද තියෙන්නේ කියලා කාටත් තේරුම් ගැනීම අසීරු නැහැ'' යි ද වෛද්‍යවරයා කියයි.

## මහනුවර දිස්ත්‍රික්කයේ වැව් නවයක් පිළිසකර කරයි

(හාරිස්පත්තුවේ මොහොමඩ් ආසික්)

වාරි සෞභාග්‍යා වැඩසටහන යටතේ ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් මහනුවර දිස්ත්‍රික්කය තුළ පසුගිය වර්ෂයේ දී රුපියල් මිලියන 12ක වියදමින් අමුණු තුනක් සහ ඇළ පද්ධති හයක ප්‍රතිසංස්කරණ නිමකර ඇති බව මහනුවර දිස්ත්‍රික් නියෝජ්‍ය ගොවිජන සේවා කොමසාරිස් තරංගා ජයසේකර මෙනවිය කියයි.

වාරි සෞභාග්‍යා වැව් ප්‍රතිසංස්කරණ වැඩසටහනට සමගාමීව මෙම ප්‍රතිසංස්කරණ කටයුතු සිදුවූ බව ද ඇය පෙන්වා දෙයි.

රුපියල් මිලියන හතරක වියදමින් දෙඩම්වෙල අමුණ, පරහගවෙල අමුණ සහ අංගම්මන ඇළ අමුණේ ප්‍රතිසංස්කරණ කටයුතු මේ වන විට අවසන් කොට ඇති බව ද ඇය සඳහන් කළාය.

වහුගහපිටිය හැවැන්දෙණිය ඇළ, ගනේගොඩ උඩවෙල රජ ඇළ, පුස්සලදෙණිය ඇළ, ලෙව්ලේදෙණිය ඇළ, බෝහක්ක පහළ ඇළ සහ තැඹිලිගල යන ඇළ පද්ධති ප්‍රතිසංස්කරණ ද මෙම වැඩසටහන යටතේ අවසන් කොට ඇති අතර ඒ සඳහා වැය කර ඇති මුදල රුපියල් මිලියන 7.5කි.

## හැටන් ප්‍රදේශයේ බිත්තරයක මිල රුපියල් 31 ට නගී

(හැටන් සුදත් එච්.එම්. හේවා)

හැටන් ප්‍රදේශයේ බිත්තර මිල ඉහළ යාමත් සමග ජනතාව විවිධ දුෂ්කරතාවයන්ට පත්ව සිටිති.

මේ පිළිබඳව අදහස් දක්වන බොහෝ පිරිසක් පවසන්නේ මේ වන විට බිත්තරයක මිල රුපියල් 29ත් 31ක් අතර පවතින බවය.

මේ පිළිබඳව කළ විමසීමක දී බිත්තර වෙළෙඳුන් පවසන්නේ කුකුල් කෑම මිල අධික ලෙස ඉහළ යාමත් සමග බිත්තර තොග මිල ඉහළ යාමෙන් මෙම තත්ත්වය උදාවී ඇති බවත්ය.

## කළුදැවල 400 කට පානීය ජලය නෑ

(මාතලේ මහේෂ් කීර්තිරත්න)

පවතින අධික නියං තත්වය හේතුවෙන් මාතලේ කළුදැවල ඉහළ කොටසේ පවුල් 40ක පුද්ගලයන් 400කට අධික පිරිසක් දැඩි අපහසුතාවයට පත්ව සිටිති.

තමන්ට පානීය ජල පහසුකම් ලබාදීම සඳහා ප්‍රදේශයේ ජල කරාමයක් සවිකර ඇතත් එය ප්‍රමාණවත් නොවන බවත් මේ පිළිබඳව අදාළ බලධාරීන් වෙත දැන්වුව ද මෙතෙක් නිසි විසඳුම් ලබා දී නොමැති බව ද ඔවුහු කියති.

ඒ නිසා ඉකුත්ද ඔවුහු උද්ඝෝෂණයක නිරත වූහ.

ජලය සපයා ගැනීම සඳහා කිලෝමීටර් ගණනාවක් පයින් යෑමට සිදුව ඇති බවත්, අධික මුදලක් ලබා දී බවුසර් මගින් ජලය ලබා ගැනීමට ද පවතින ආර්ථික තත්ත්වය හමුවේ නොහැකි වී ඇති බවත් ඔවුහු කියති.



## ජලය, විදුලිය, ඉන්ධන භාවිතය සියයට 50 කින් අඩුකරන්න

### ආණ්ඩුකාරවරයාගෙන් රජයේ නිලධාරීන්ට උපදෙස්

(සෙංකඩගල ඉඳුනිල් කහටපිටිය)

මධ්‍යම පළාත් සභාව යටතේ ඇති රාජ්‍ය ආයතනවල ජලය, විදුලිය හා ඉන්ධන භාවිතය අවම කිරීමට පියවර ගන්නා ලෙස ආණ්ඩුකාරවරයා උපදෙස් දෙයි.

පළාත් රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ සාකච්ඡාවක් කැඳවමින් මහනුවර පිහිටි පළාත් ආණ්ඩුකාර ශ්‍රවනාගරයේ දී ආණ්ඩුකාරවරයා මෙම දැනුම් දීම කළේය.

ජල පෝෂක ප්‍රදේශවලට වර්ෂාව නොලැබීමත් ඉන්ධන ගැටලුවත් හේතුවෙන් ඇතිව තිබෙන විදුලි අර්බුදය කළමනාකරණය කර ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම සඳහා ආණ්ඩුකාරවරයා මෙම රැස්වීම කැඳවා තිබිණි.

එහි දී අදහස් දක්වමින් ආණ්ඩුකාර ගමගේ මෙසේ ද පැවසුවේය.

රාජ්‍ය ආයතන පරිශ්‍රයන්හි අවශ්‍යතා නිසි ලෙස හඳුනා ගනිමින් විදුලි, ජලය, ඉන්ධන භාවිත කළ යුතුයි. එමගින් 20% ත් 50% අතර ප්‍රමාණයකින් විදුලිය පරිභෝජනය අවම කිරීමේ ඉලක්කයක් ඇතිව සෑම ආයතනයක් ක්‍රියා කිරීම වැදගත්. මාසිකව එය අධීක්ෂණය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස් කරනවා.

මධ්‍යම පළාතේ පාසල් දහසක සූරිය බල පද්ධති ස්ථාපිත කිරීම මගින් බලශක්ති සම්පාදනය සඳහා දැනටමත් පියවර ගෙන තිබෙනවා. ඉදිරියේ දී එහි කටයුතුවල විශාල ප්‍රගතියක් බලාපොරොත්තු විය හැකිය. පාසල් දරුවන් දැනුවත් කරමින් ඔවුන් මගින් බලශක්තිය අරපිරිමැසුම්දායක ලෙස භාවිත කිරීම පිළිබඳ දැනුම හා ආකල්ප ප්‍රජාව වෙත ගෙන යෑම කෙරෙහි අවධානය යාමු කරන්න ඕන. ඒ සඳහා පාසල් සහ විවෘත අංශ යටතේ චිත්‍ර, පෝස්ටර් හා රචනා නිර්මාණ තරඟාවලියක් සම්පාදනය කිරීමටත් සැලසුම් කරනවා.

## ඩීසල් නොමැතිකමින් තේ දලු ප්‍රවාහනයත් නවතී

(මාතලේ මහේෂ් කීර්තිරත්න)

මාතලේ දිස්ත්‍රික්කයේ කුඩා තේ වතු හිමියන්ගේ තේ දලු ප්‍රවාහනය කරන ලොරිවලට ඩීසල් සොයා ගැනීමේ අපහසුව නිසා තමන් අපහසුතාවයට පත්ව සිටින බව කුඩා තේ වතු හිමියෝ පවසති.

මාතලේ දිස්ත්‍රික්කයේ රත්තොට, යටවත්ත, අඹන්ගඟකොරලය, උකුවෙල ආදි ප්‍රදේශවල වැඩි වශයෙන් කුඩා තේ වතු ඇති අතර ඔවුහු මේ තත්වය හමුවේ දැඩි අපහසුතාවයට පත්ව සිටිති.

කුඩා තේ වතු හිමියන් තම ඉඩම්වලින් නෙළාගන්නා තේ දලු නගරයේ පිහිටි තේ කර්මාන්ත ශාලා සඳහා රැගෙන යාමේ දී නියමිත දිනට ප්‍රවාහනය කිරීමට නොහැකි වීම නිසා දැඩි අපහසුතාවයට පත්වන බව ද ඔවුහු කියති.

## වෛද්‍යවරයකු නැතිව කුරුගොඩ ඒකකය වහලා

(නුවරඑළිය සම්පත් ජයලාල්)

වෛද්‍යවරයකු නොමැති නිසා මහනුවර දිස්ත්‍රික්කයේ කුරුගොඩ ප්‍රාථමික වෛද්‍ය ඒකකය මාස ගණනාවක් තිස්සේ වසා දමා ඇති බව වාර්තා වෙයි.

මෙම වෛද්‍ය ඒකකය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් මාතලේ මහ රෝහලේ සේවය කරන වෛද්‍යවරයකු පත්කර ඇතත්, ඔහු තවමත් එහි වැඩ භාරගෙන නොමැත. ඊට හේතු වී ඇත්තේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ලබා දී ඇති ස්ථාන මාරු නියෝගය මාතලේ රෝහල් අධ්‍යක්ෂවරයා විසින් ක්‍රියාත්මක නොකිරීම බව සෞඛ්‍ය අමාත්‍යාංශ ආරංචි මාර්ග සඳහන් කරයි.

දණහිස් වේදනාවට දීර්ඝ කාලීනව බෙහෙත් ගැනීම වකුගඩු නරක් වීමට හේතුවන බව ඔබ දන්නවාද?
දණහිස් අමාරුවට තිට්ටාවට සුවය.....
PRP ප්‍රතිකාර ක්‍රමය මගින් කාටිලේජ නැවත වර්ධනය කර දනහිස් අමාරුව තිට්ටාවට සුව කර ගන්න.
Kandy Central Hospital Pvt (Ltd)
127/ 3, ගොඩපොල, ගෙලිඔය.
තොරතුරු සඳහා අපට කතා කරන්න. 081 2314 500 / 077 7132 352
CENTRAL

නහර ගැටගැසීම ශල්‍යකර්මයකින් තොරව සුව කරගන්න
ඉතා අඩු වියදමකින්, අඩු වේදනාවකින් සහ අවම කාලයකින් ඕනෑම සංකූලතා සහිත නහර ගැට ගැසීම් තත්වයක් සුව කර ගැනීමට අප වෙත පැමිණෙන්න
තොරතුරු සඳහා
අපට කතා කරන්න 081 2 314 500 / 0777 132 352
CENTRAL

ඉරිදා මැදරට

2022 මාර්තු මස 13 වැනිදා ඉරිදා

# ඩොලර් අර්බුදය මේ තරම් උග්‍ර එකම රට ලංකාවයි

## අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ හිටපු කැඳවුම්කරු සංජීව බණ්ඩාර

**අද රටෙහි බරපතළ ආර්ථික හා දේශපාලන අර්බුදයක් හටගෙන ඇති බවත්, ජනතාව ප්‍රසිද්ධියේ ආණ්ඩුව විවේචනය කිරීම ඒ අර්බුදයේම ප්‍රකාශනයක් බවත්, අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ හිටපු කැඳවුම්කරු සංජීව බණ්ඩාර මහතා පවසයි.**

නුවරඑළියේදී පැවති ජනහමුවක් අමතමින් ඔහු වැඩි දුරටත් මෙසේද පැවසීය.

හැමෝම ආර්ථික අර්බුදයක් ගැන කතා කරනවා. ආණ්ඩුවත්, විපක්ෂයත් පැහැදිලි ඇති අර්බුදය ගැන කතා කළත් ස්ථිරසාර විසඳුමක් ඉදිරිපත් කරන්නේ නෑ. ඔවුන් පරණ පුරුදු විසඳුම තමයි ඉදිරිපත් කරන්නේ.

මොකද්ද මේ අර්බුදය? කොහෙන්ද අර්බුදය තියෙන්නේ? අද මෙහෙම අය ආර්ථික අර්බුදයක් ගැන කතා කරනවා. ඒ වගේම බරපතළ විනාශකාරී අන්තයකට අපේ රට හැටියට ගමන් කරමිනුයි ඉන්නේ. ඉතිහාසයේ කවදාවත් නැති විධිහට ආර්ථිකය කඩාවැටෙමින්, බිඳවැටෙමින් තියෙනවා. අද වෙනකොට සාකච්ඡා වෙන ප්‍රශ්නයක් තමයි රට මුහුණ දෙන මූල්‍ය අර්බුදය. විනිමය අර්බුදයකට ආණ්ඩුව මුහුණ දීලා තියෙනවා. ඩොලර් හිඟය අද බරපතළ ගැටලුවක්. ඒක රටේ ආර්ථිකයට විවිධ මට්ටමෙන් බලපෑම් කරනවා. විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නට පස්සේ අපි ලෝක ආර්ථිකයත් එක්ක බද්ධ වෙලයි ඉන්නේ.

ලෝක ආර්ථිකයත් එක්ක බද්ධ වෙලා ඉඳිද්දී රුපියල්වලින් ගනුදෙනු කරන්න බෑ. ජාත්‍යන්තර මුදල් එක්කයි ගනුදෙනු කරන්න වෙන්නේ. අනිත් පැත්තෙන් විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නට පස්සේ දේශීය නිෂ්පාදන කඩාවැටිලා ආනයන මත යැපෙන තත්ත්වයක් නිර්මාණය වෙලා තියෙනවා. අත්‍යවශ්‍ය භාණ්ඩ බොහොමයක් අද පිටරටින් ආනයනය කරනවා. ඒවා ආනයනය නොකර අපිට පවතින්න පුළුවන්කමක් නෑ. ඒ වගේම ආනයනය කරන්න ඩොලර් අවශ්‍ය වෙනවා. රුපියල්වලින් ගෙවලා පිටරටින් බඩු ගන්න පුළුවන්කමක් නෑ. ලංකාවේ ඕන තරම් මුදල් අච්චු ගහලා නාවකාලිකව උත්තර හොයන්න ආණ්ඩුවට පුළුවන්කම තිබුණත් ලෝකෙත් එක්ක ගනුදෙනු කරන්න එහෙම හැකියාවක් නෑ.

ඩොලර් නෑ කියන්නේ සමස්ත ආර්ථිකයම කඩාවැටීමට ලක්වෙනවා කියන එකයි. දැනටමත් ඉන්ධන අර්බුදයක් තියෙනවා. විශාල බලශක්ති අර්බුදයකට අපි මුහුණ දීමින් ඉන්නවා. ප්‍රමාණාත්මක වර්ෂාවක් ලැබුණත් රටේ බලශක්ති අවශ්‍යතාවය සම්පූර්ණ කරන්න ජල විදුලි බලාගාරවලට හැකියාවක් නෑ. ඒක නිසා විදුලි සැපයුම අඛණ්ඩව පවත්වාගෙන යන්න ඉන්ධන අවශ්‍ය වෙනවා. මේ වෙනකොට අපේ ගල් අඟුරු සංචිත වේගයෙන් අඩුවෙමිනුයි පවතින්නේ. ඒවා සපයාගන්න ආණ්ඩුවට හැකියාවක් නෑ. අද කරන්නේ පරිභෝජනය අඩුකරන්න මිල වැඩි කරන එකයි.

> **පවුලක මාසික වියදම රුපියල් දහ පහළොස් දහසකින් වැඩි වෙලා. එක පැත්තකින් භාණ්ඩ හිඟයක් ඇවිල්ලා, අනික් පැත්තෙන් භාණ්ඩ මිල ගණන් ඉහළ ගිහින් තියෙන තත්ත්වයක් ඇතුලේ වෙළෙඳ මාෆියාවක් රට තුළ නිර්මාණය වෙලා.**

නමුත් මිල වැඩි කළ පමණින් පරිභෝජනය අඩු වෙන්නේ නෑ. ඒකට හේතුව තමයි සමහර අත්‍යවශ්‍ය දේවල් කප්පාදු කරන්න නොහැකි වීම. මෙතැනි තත්ත්වයක් මත ඉදිරියේදී අනිවාර්යය බලශක්ති අර්බුදයක් ඇති වීම වැළැක්විය නොහැකියි. දිනකට පැය හතරක් පහක් විදුලිය කැපීමේ අනතුරක් තියෙන බව තමයි ඒ ක්ෂේත්‍රයේ විද්‍යාඥයින් අනතුරු අඟවන්නේ. අපි හැමෝම අඳුරේ ඉන්න වෙන්නේ. ඒක වළක්වන්න බෑ.

ඒ වගේම ඩොලර් හිඟයත් එක්ක ආනයන සීමා කරන්න සිද්ධ වෙනවා. ආනයන සීමා කිරීමෙන් සිද්ධ වෙන දේ තමයි දේශීය භාණ්ඩ මිල ගණන් ඉහළ යාම. භාණ්ඩ සැපයුම අඩුවුණාට පස්සේ භාණ්ඩ හා සේවාවල මිල ගණන් ඉහළ යන එක පෙරළා පාරිභෝගික ජනතාවට තමයි භුක්ති විඳින්න වෙන්නේ. ඒ පීඩනය ඔවුන් මත පැටවෙන එක වළක්වන්න බෑ. දැනටමත් ජනතාව ඒ ගැටලුව නිසා විවිධ පැතිවලින් බැට කනවා. මේ වෙද්දි උද්ධමන අනුපාතය 11% ත් ඉක්මවලා. 2021 ජනවාරි උද්ධමන අනුපාතය තිබුණේ 3.7% යි. උද්ධමන අනුපාතය ඉලක්කම් දෙකේ අගයක් ගන්නවා කියන්නේ ඉතාම බරපතළ තත්ත්වයක්.

අපි ගණන් හදලා බැලුවොත් පවුලක මාසික වියදම රුපියල් දහ පහළොස් දහසකින් වැඩි වෙලා තියෙනවා. ඒක ජනතාවට දරා ගන්න බැරි තත්ත්වයක්. එක පැත්තකින් භාණ්ඩ හිඟයක් ඇවිල්ලා, අනික් පැත්තෙන් භාණ්ඩ මිල ගණන් ඉහළ ගිහින් තියෙන තත්ත්වයක් ඇතුලේ වෙළඳ මාෆියාවක් රට තුළ නිර්මාණය වෙලා. ගෑස් අර්බුදය වගේ දේවල් ඒකේ ප්‍රතිඵලයයි. භාණ්ඩ හිඟයක් ඇති වුණාම සාමාන්‍යයෙන් වෙන දේ තමයි කළු කඩවලට අවස්ථාවක් සැලසෙන එක. ඒ වගේම භාණ්ඩවල ප්‍රමිතිය කඩාවැටෙනවා. වෙළඳපොළ බලන්නේ ලාභ උපයන්න. එතකොට ප්‍රමිතිය, ගුණාත්මක භාවය වගේම ජන ජීවිත අදාළ වෙන්නේ නෑ. ලාභය තමයි ප්‍රමුඛතාවයට පත්වෙන්නේ.

අද වෙන විට බරපතළ ආහාර අර්බුදයක් ඇති වෙමින් තියෙනවා. අස්වැන්න විශාල ලෙස අඩුවෙලා. මොකද්ද ඒකට හේතුව? ආණ්ඩුව හැම ප්‍රශ්නෙකටම හේතුව කොරෝනා වසංගතය කියනවා. ඒක නිසා කරන්න දෙයක් නෑ කියලයි ඔවුන් කියන්නේ. නමුත් ඒක නෙමෙයි ඇත්ත. වසංගතය නිසා වුණු බලපෑමක් තියෙනවා. නමුත් වසංගතය පාලනය කිරීම සඳහා වන හොඳම වැඩසටහනක් ආණ්ඩුවට තිබුණේ නෑ. වසංගතය එක්කත් ආණ්ඩුව සෙල්ලම් කළා. දැන් ආසියාවේ පළවෙනියට වැක්සින් කරපු රට අපි කියලා කයිවාරු ගහනවා. හැබැයි මේ වසංගතය සම්බන්ධයෙන් ආණ්ඩුව ගනුදෙනු කරපු ආකාරය පිළිබඳව අපිට සතුටු වෙන්න බෑ. වසංගතය රටට ඇතුළු වුණෙත් ආණ්ඩුවේ නොහැකියාව නිසයි. පළමුවැනි, දෙවැනි, තුන්වැනි රැලි හරහා ජීවිත විශාල ප්‍රමාණයක් අහිමි වුණෙත්, මාස ගණනක් රට ලොක්ඩවුන් කරලා තියන්න සිද්ධ වුණෙත් කාගෙ වරදින්ද? ජනතාවගේ වරදින් නෙමෙයි, ආණ්ඩුවේ වරදින්. ආණ්ඩුවේ අත්තනෝමතික, හිතුවක්කාරී වැඩපිළිවෙළ නිසා තමයි එහෙම වුණේ. වසංගතය පාලනය කිරීම සම්බන්ධයෙන් නිශ්චිත පැහැදිලි වැඩපිළිවෙළක් නැතිකමින් කොරෝනා ව්‍යාප්තිය වැඩි වුණා. ආණ්ඩුව ඒ සඳහා සැලසුම් සහගත මැදිහත්වීමක් කළේ නෑ.

> **ආණ්ඩුව හැම ප්‍රශ්නෙකටම හේතුව කොරෝනා වසංගතය කියනවා. ඒක නිසා කරන්න දෙයක් නෑ කියලයි ඔවුන් කියන්නේ. වසංගතය නිසා වුණු බලපෑමක් තියෙනවා. නමුත් වසංගතය පාලනය කිරීම සඳහා හොඳම වැඩසටහනක් ආණ්ඩුවට තිබුණේ නෑ. වසංගතය එක්කත් ආණ්ඩුව සෙල්ලම් කළා**

දැන් ආණ්ඩුව කියන්නේ ආර්ථිකය කඩාවැටුණේ රට දීර්ඝ කාලයක් ලොක්ඩවුන් කළ නිසා කියලයි. නමුත් ආණ්ඩුව රට ලොක්ඩවුන් කළා නෙමෙයි, ලොක්ඩවුන් වුණා. ආණ්ඩුව හැම වෙලාවෙම කළේ සැලසුමක් ඇතුව රෝගය පාලනය කිරීම සඳහා ලොක්ඩවුන් කරන එක නෙමෙයි. රෝගය පැතිරෙන්න දීලා ඉබේම ලොක්ඩවුන් වෙන තත්ත්වයට රට පත්කරන එකයි. එහෙම වුණාම ආර්ථිකය කඩාවැටෙන එක නවත්වන්න බෑ. ඒකේ වගකීම ගන්න ඕනේ ආණ්ඩුවයි.

ආණ්ඩුව වසංගතය කිය කියා, හැමදෙයක්ම ඒකෙන් වහන්න හැදුවට ලෝකයේ අනික් රටවල් වසංගතය නිසා කඩාවැටිලා නෑ. මේ තරම් විනිමය අර්බුදයක් නිර්මාණය වෙලා තියෙන ලෝකයේ එකම රට ශ්‍රී ලංකාවයි. අනෙක් රටවල් වසංගතයත් එක්ක විනිමය ඉතිරියක් නිර්මාණය කරගෙන තියෙනවා. ඒකට හේතුව තමයි වසංගතයත් එක්ක සමහර වියදම් අඩුවීම. පරිභෝජන සීමා කිරීම් එක්ක ඒ රටවල් යම් අතිරික්තයක් ආර්ථිකයේ ඇති කරගත්තා. හොඳම උදාහරණය තමයි අපේ අසල්වැසි බංගලාදේශය. ඔවුන් විනිමය අතිරික්තයක් ඇති කරගත්තා විතරක් නෙමෙයි, අපේ වගේ රටවලට ණයටත් මුදල් දෙනවා. නමුත් අපේ රටේ සිද්ධ වෙලා තියෙන්නේ අහිතකර ආර්ථික ප්‍රතිපත්ති නිසා රට තවත් කඩාවැටීම පමණයි. එහෙනම් වරද තියෙන්නේ කොහෙද? ආණ්ඩුවේ නේද? ඒක නිසා වසංගතය ඉදිරියට දලා තමන්ගේ නොහැකියාව වසාගන්න ආණ්ඩුවට හැකි වෙන්නේ නෑ.

> **අනෙක් රටවල් වසංගතයත් එක්ක විනිමය ඉතිරියක් නිර්මාණය කරගෙන තියෙනවා. හොඳම උදාහරණය තමයි අපේ අසල්වැසි බංගලාදේශය. ඔවුන් විනිමය අතිරික්තයක් ඇති කරගත්තා විතරක් නෙමෙයි, අපේ වගේ රටවලට ණයටත් මුදල් දෙනවා.**


අද ආණ්ඩුව රුපියල් අච්චු ගහලා මැජික් පෙන්නන්න හදනවා. ඒ සඳහා අපිව ගොනාට අන්දනවා. අනෙක් අතින් විනිමය අර්බුදයට උත්තර හොයන්න ලෝකේ වටේ හිඟා කනවා. ඒ අතර ආර්ථික මර්මස්ථාන ඇතුළු රටේ සම්පත් කුණුකොල්ලෙට විකුණන්න දත කනවා. දැනටමත් ඒ සඳහා පිඹුරුපත් සකසලා අවසානයි. මේ හැම දෙයක්ම පෙළ ගැහෙන්නේ ජනතාව තව තවත් පෙළෙන දිසාවටයි. විපක්ෂය කියන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න කියලයි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි ක්‍රියාත්මක කළාම හොරකම, දූෂණය, වංචාව නවතිනවලු. 1977 ඉඳලා බලයට ආපු ආණ්ඩු, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසි ඉටු කළා, ඒත් හොරකම දූෂණය වංචාව නැවතුණාද? නෑ. අපි දන්නවා පහුගිය ඉතිහාසය පුරාම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල දාපු කොන්දේසි මොනවද කියලා. ඒ කොන්දේසි තමයි, රාජ්‍ය වියදම් අඩුකරන්න, අධ්‍යාපනයට, සෞඛ්‍යයට වෙන්කර ඇති මුදල් කපා හරින්න, සුභසාධන කප්පාදු කරන්න. බදු ප්‍රතිපත්ති සංශෝධනය කරන්න, රාජ්‍ය ආයතන විකුණනන්න ආදී දේවලුයි. ඒවගෙන් ජනතාවට සහනයක් තියෙනවද? ධනපතියන්ට තව තවත් මුදල් පොදි ගහන්න මේ කොන්දේසිවලින් අවස්ථාව සැලසෙනවා. රටේ ආර්ථිකය තව තවත් බිඳවැටෙනවා. රාජ්‍ය ආයතන විකුණුවාම ආණ්ඩුව මුදල් හොයාගන්න ජනතාව මත බදුබර පටවනවා. මේ ඔක්කොම පෙළගැහෙන්නේ අපි තව තවත් උගුලේ හිරකරන දිසාවට. ඒ නිසා කවුරු බලයට ආවත් අපිට නම් වෙනසක් පේන්නේ නෑ. කළ යුතු වන්නේ මේ ක්‍රමවේදය වෙනස් කිරීමයි. එහෙම නැතුව පුද්ගලයන් වෙනස් කළ පමණින් මේ අර්බුදයට විසඳුමක් ලැබෙයි කියලා කියන්න හැකියාවක් නෑ. ඒ සඳහයි ජනතාව දැනුවත් වෙන්න ඕනේ. පෙළගැහෙන්න ඕනේ.

**සටහන හා ඡායාරූපය**
**නුවරඑළිය සම්පත් ජයලාල්**









# ලූ.ලූ.ලූ...

## නගරාධිපති මර නින්දේ පදිකවේදිකාවේ ස්ථිර කඩ



පදික වේදිකා තියෙන්නේ ඇවිදගෙන යන්නලු. ඒ වුණාට සමහර පදික වේදිකාවල සමහර තැන්වලින් යන්න ඕන පාරට බැහැලලු. ඒ සම හරක් කරන වැඩ නිසාලු. මේක තියෙන්නේ බෝගම්බර පැත්තෙලු.

වලව් නෝනා කෙනෙක්ගේ නම තියෙන පාරක්ලු. ඒකේ පදික වේදිකාවේ ටික දුරක් ගියාම පාරට බහින්න වෙනවලු. ඒ පදික වේදිකාවේ තියෙන ගඳගහන කඩයක් හින්දලු. පොළ දවසට පදික වේදිකාව අවහිර වෙනවලු. ඒ වුණාට මේ කඩේ හැමදාම මෙතනලු. නගර සභාවේ මහත්තුරු මේකට කිසිම ඇක්ෂන් එකක් ගන්නේ නැලු.

චණ්ඩිපාට් නැති අහිංසකයෙක් මේක කෙරුවනම් මෙලහකටත් නගර සභාවේ උන්දලා හොඳ නාඩගමක් නටලලු. එක නීතියක් එක රටක් කියන එක බල්ලට ගිහින්ලු. මෙතෙන්ට කවුරුත් අත තියන්නේ නැලු. මොනවා හරි කිව්වොත් අතක් පයක් කපාගෙන යයි කියලා සමහරු බයයිලු. මේක කරන කෙනා ජනතාව නියෝජනය කරන කෙනෙක්ලු.

මෙයා මැණික් කුඹුරෙත් වැඩදපු කෙනෙක්ලු. එතන බිස්නස් කරන්න පුළුවන් කඩ තියෙන අයටලු. ඒ වුණාට මෙයාට ටෙන්ට් එකක් ගහලත් වැඩේ කරගෙන යන්න පුළුවන්ලු. මෙයාගේ පැටිකිරිය දන්න නිසා දම්සක් මහත්තුරුත් කටක් අරින්න බයයිලු. මෙයා සභාවේ කටක් අරිනවා තාම දැකලා නැහැලු. ඒ වුණාට ජනතාව නම් ඡන්දෙත් දීලා අරිනවලු.

## රථ වාහන අංශයේ දෙන්නෙක් මගුල් ගෙවල්වලින් ජරාව ඉල්ලයි




හැම අඳුරු වළාවකම රිදී රේඛාවක් තියෙනවාලු. කොවිඩ් ගැනත් එහෙම කතා කිව්වාලු. කොවිඩ් නිසා රිදී රේඛාවක් පායපු දම්සක් මහත්තුරු දෙන්නෙක් ඉන්නවාලු. එයාලගේ ඉණේ ඉඳන් උරහිසට සුදු පටිත් තියෙනවාලු.

මේ දෙන්නට මගුල් ගෙවල් පෙන්නන්න බැලු. කොවිඩ් නිසා පනවලා තිබෙන සීමා මෙයාලට රිදී රේඛාවක්ලු. මගුල් තියෙන හෝටල්වලට මෙයාලා එන්නේ කට්ටිය බීලා ඩාන්ස් කරන වෙලාවටලු. හිමින් සැරේ ඇවිත් කොවිඩ් නීති ගැන කට්ටියට මතක් කරලා දෙනවලු.

ඉන්න පුළුවන් ගාන ගැනත් සිහිපත් කරලා දෙනවලු. අනේ සර් මොනවත් කරන්න එපා කියලා කට්ටිය බැගෑපත් වෙනවලු. හරි හරි වැඩේ ගොඩින් බේරගමු කියලා දෙන්නා වැඩේට එන්ටර් වෙනවලු. බත් පැකට් දෙකයි බෝතලයයි දුන්නම වැඩේ ෂේප්ලු.

වෙඩින් එක කට්ටිය බොන්නේ වීස්කි නම් මෙයාලට ලැබෙන්නේත් විස්කිලු. වෙඩින්වල පොටෝ ගන්න උදවියට දැන් මේක නෝට් වෙලාලු. යකෝ මුන් දෙන්නා යන යන තැනට එනවනේ කියලා උන් කියනවලු. මේවා හරි කැත වැඩලු. ලොක්කෝ ඇල්ලට බේසම් පටවද්දී පුදුමේ පොඩ්ඩෝ මේවා නොකෙරුවොත්ලු. මහ කකුළුවෝ ඇදේට යද්දී පොඩි එවුන් යන්නේ කොහොමත් ඇදේට කියන්නේ මේවටලු.

## අලුත් කැබිනට් ඇමැති පමාවෙන් කෝච්චියේ ගමන පැයකින් පස්සට




ඇල්ලට කෝච්චිය යන්න තිබුණේ උදේ හතටලු. ඒ වුණාට යන්න වුණේ අටටලු. ඒ ඇමැතිතුමා පරක්කු වුණ නිසාලු. කැබිනට් එකට පත්කළාට පස්සේ සහභාගි වුණු මංගල උත්සවේලු. කෝච්චියක් පරක්කු වුණොත් ඒ ලයින් එකම අවුල් වෙනවලු.

මේක ඇමැතිතුමා නොදැන හිටියද සැකයිලු. ඒ වුණාට උපදෙස් දෙන්න ඉන්න හැටහුටාමාරට මේක අමතක වීම පුදුමයක්ලු. වෙලාවට ගමන යන්න පන්දහේ ටිකට් ගත්ත විදේශ රටවල ඇත්තෝ මේ නිසා හිටියේ පුල් අවුලෙන්ලු. ඒ මේවගේ නාඩගං ඒ රටවල්වල නැති නිසාලු. ඇයි කෝච්චිය යන්නේ නැත්තේ ඇහුවම මිනිස්ටර් එනකන් කිව්වලු.

ඇයි මිනිස්ටර් කියලා ඇහුවම දුම්රිය ඇත්තෝ එයා එනකල් යන්න බෑ කිව්වලු. වැඩිගාණක් ගෙවලා යන නිසා මේ කොච්චියට වැඩි ප්‍රමුඛතාවක් දෙනවලු. ගමන පරක්කු වුණු නිසා ඒ පරිප්පු සේරම කන්න වුණේ උඩරට මාර්ගයේ අනිත් දුම්රියවලටලු. වරදක් කළොත් දඩුවම් විඳින්න ඕන වරද කළ කෙනාලු. ඒත් ඇමැති පරක්කුවෙන් දඩුවම් විඳින්න වුණේ වරදක් නොකළ අයටලු. කොහොම වුණත් පරක්කු වුණ ඇමැතිට වචනයක් කියන්න ගටක් කාටවත් තිබ්බේ නැලු. තමන්ගේ අයිතීන් ඉල්ලලා කෑගහන වෘත්තීය සමිති ලොක්කෝ හිටියේ කුක්කෝ වගේලු.

## නමට ජාතික පාසල් කරලා වියතා පටි රෝල් කරගෙන




ජාතික පාසල් ගොඩට එකතු වෙන්න හිටියේ හරි ආසාවෙන්ලු. දැන් ඉතින් වැඩේ කෙරිලලු. ඒ වුණාට වෙච්ච දෙයක් නැලු. වැඩකට වුණේ ලොකුවට උත්සව තියපු එක විතරයිලු. බෝඩ් එක වෙනස් කළා විතරයිලු.

ඒ වුණාට බස් එක ඒකමලු. කරන්න කලින් ළමයින්ට සිහින ලෝකයක් පෙන්නුවලු. ලොකු ලොකු ඉස්කෝලවල පහසුකම් අපිටත් ලැබෙනවා කිව්වලු. ඒ වුණාට හම්බවුණු කෙංගෙඩියක් නැලු. ටීචර් ජාතික වුණා කියලා අපිට කිසිම දෙයක් ලැබුණේ නැහැනේ කියලා ළමයි අහනවලු. ඇයි ළමයිනේ කවදවත් එන්නේ නැති ලොකු මහත්තුරු ඇවිත් ගිය එකම මැදයි කියලා එතකොට ගුරුවරු කියනවාලු.

මුලින් ජාතික පාසල් තේරුවේ නිලධරීන්ලු. ඒක ගැන මැති ඇමැතිවරු විරෝධයක් දැම්මේ අධ්‍යාපන බලධාරීන් ඉදිරියේමලු. කොහොම හරි මැති ඇමැති හඬට වියත් තුමත් ශක්තිය දුන්නලු. නිලධාරීන්ගේ තේරීම පැත්තකට ගිහින් දේශපාලන තේරීම ඉස්සරහට ආවේ ඒ විදිහටලු. ඒකේ වැරදි අඩුපාඩු දැන් කියලා වැඩක් නැලු. ජාතික කළානම් ළමයින්ට දැනෙන වෙනසක් අත්කර දීම බලධාරීන්ගේ වගකීමලු. ඒ වුණාට එහෙම දේකට උනන්දුවක් පේන්න නැලු. මේක වෙනුවෙන් මැදරට පවත්වපු උත්සවේට ලක්ෂ ගාණක් වියදම් කළාලු. එද කාලා බීලා ගිය මහත්තුරු දෙනවා කිව්ව පහසුකම් අරන් ආයෙත් එනකල් දරුවන් බලාගෙන ඉන්නවාලු.

**බකමූණා**

# කැලෑ ගිනි තැබීමෙන් වැනසෙන පරිසරය

**පවතින වියළි කාලගුණ තත්ත්වය හමුවේ මේ වන විට මධ්‍යම කඳුකරයේ කැලෑ ගිනිතැබීම් විශාල වශයෙන් වාර්තාවන අතර ඒ හේතුවෙන් විශාල වන විනාශයක් වෙයි.**

වාර්ෂිකව සිදුවන කැලෑ ගිනි තැබීම් හේතුවෙන් දිවයින පුරා 2020 වර්ෂයේ දී පමණක් කැලෑ ගිනි ගැනීම් හේතුවෙන් හෙක්ටයාර් 196 ක් විනාශ වී ඇත. 2019 වර්ෂයේ දී 171 ක් කැලෑ ගිනි ගැනීමේ සිද්ධි වාර්තා වී ඇති අතර ඉන් හෙක්ටයාර 1,068 ක භූමි ප්‍රමාණයක් විනාශ වී ඇති බව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වාර්තා පෙන්වා දෙයි.

මෙරට සිදුවන වනාන්තර ගිනි තැබීම සම්බන්ධයෙන් අදහස් දක්වන ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ, ව්‍යවහාරික විද්‍යා පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ආචාර්ය දර්ශනී සිංහලගේ මහත්මිය මෙසේ සඳහන් කළාය.

මෙරට වනාන්තර ගිනි තැබීම බහුල වශයෙන් සිදුවන්නේ වියළි සහ උණුසුම් කාලගුණ තත්ත්වයන් පවතින අවස්ථාවන්හිදියි. මේ දිනවල පවතින වියළි කාලගුණික තත්ත්වය වනාන්තර ගිනි ගැනීම සඳහා රුකුලක් සපයනවා. මෙරට ලැව්ගිනි හටගැනීම දුලබ සිදුවීමකි. නමුත් මිනිස් බලපෑම් හෝ සිතා මතා සිදුකරනු ලබන ගිනි ගැනීම් මේ දිනවල සුලබ දසුනක් වී තිබෙනවා. මෙම ගිනි තැබීම් වියළි තණ බිම්, සැවානා වැනි වියළි වනාන්තර සහ විශාල වියළි කලාපීය, කඳුකර හෝ තෙත් කලාපීය වනාන්තර තුළ පාලනයකින් තොරව පැතිර යනවා.

ලෝකයේ වෙනත් රටවල වනාන්තර ගිනි තැබීම පරිසර සංරක්ෂණ ක්‍රමවේදයක් ලෙස කරනවා, මෙහිදී ආක්‍රමණශීලී ශාක මර්දනය සඳහා පාලනයක් සහිතව ගිනි තැබීම් කරනවා. මේ යටතේ තෙත් බිම ආරක්ෂා කිරීම සඳහා ද ක්‍රමවත් ලෙස ගිනි තැබීම සිදු කරනවා. නමුත් ශ්‍රී ලංකාවෙහි මෙවැනි ක්‍රමවේද අත්හදා බැලීමක් සිදුකර නැහැ. හේන් වගාව මෙරට පැරණිතම වගා ක්‍රමයක්. හේන් බිම් සැකසීමේදී අවශේෂ වූ වනාන්තර (Forest Patches) ගිනි තැබීම වියළි කලාපයේ දක්නට ලැබෙන තවත් සුලබ දසුනක් ලෙස පෙන්වා දිය හැකියි.

දැව ජාවාරම්කරුවන් විසින් අවිධිමත් ආකාරයට දැව ලබාගැනීම සඳහා ගිනි තැබීම් සිදුකරනවා. දැවමය ඉන්දන අවශ්‍යවන ගඩොල්, බේකරි කර්මාන්තවලත්, ගෘහස්ත දැව ඉන්දන සපයා ගැනීම සඳහාත් බහුවල ලෙස ගිනි තැබීම් යොදා ගන්නවා. එසේම ගිනි තැබීම මගින් සතුන් දඩයම් කිරීම සිදුකරනවා. එය අනුමත නොකළ ක්‍රමවේදයක්, නමුත් රහසිගතව සිදුකරන මෙම ක්‍රියාවලි දිවයිනේ බොහෝ ප්‍රදේශවලින් වාර්තා වෙනවා. හාවුන්, මුවන්, මී මින්නන්, ගෝනුන් වැනි සතුන් දඩයම කිරීම සඳහා තණ බිම් සහ සැවානා බිම් ආශ්‍රිතව මෙය බහුලව දක්නට ලැබෙනවා.

**වර්තමානයෙහි ශ්‍රී ලංකාවේ වන වැස්ම මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 29.4 පමණ වෙයි. මෙම වැස්ම අඩුවී යාම සඳහා ගිනි තැබීම හේතු පාදක වී තිබේ. ගිනි තැබීමකදී වන වැස්ම අක්කර ගණනක් විනාශ වී යයි. එමෙන්ම වියළි කාලගුණික තත්ත්වයක් තවදුරටත් වර්ධනය වෙයි. ජල මූලාශ්‍ර සිඳී යාමත්, මිනිසාට ජල හිඟයකට මුහුණ දීමටත් සිදුවෙයි.**

තවත් නොදැනුවත් සහ පරිසරය ගැන නොතකන පිරිස් තම හුදෙක්ම විනෝදාස්වාදය සඳහා කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව වනාන්තර සහ ලඳු බිම් ගිනි තැබීම් සිදුකරනවා. ගවයින්, එළුවන් වැනි උලා කන සතුන් සඳහා ආහාර සපයා ගැනීමේදී, නව දළු, පත්‍ර උපදවා ගැනීමට තණ බිම් ගිනි තැබීම සිදුකරනවා. එසේම සතුන් පන්නා දැමීම, ඉඩම් අත්පත් කර ගැනීමත් සහ රාත්‍රී ගිනිමල සංදර්ශන සඳහා ද වනාන්තර ගිනි තැබූ අවස්ථා වාර්තා වෙනවා.

වනාන්තර සහ කැලෑ ගිනි තැබීම නිසා පරිසරයටත් මිනිසාටත් බොහෝ හානිකර තත්ත්ව උදාවෙනවා. වර්තමානයෙහි ශ්‍රී ලංකාවේ වන වැස්ම (Forest Patches) මුළු භූමි ප්‍රමාණයෙන් සියයට 29.4 පමණ වෙනවා. මෙම වැස්ම අඩුවී යාම සඳහා ගිනි තැබීම හේතු පාදක වී තිබෙනවා. ගිනි තැබීමකදී වන වැස්ම අක්කර ගණනක් විනාශ වී යාම සිදුවෙනවා. එමෙන්ම වියළි කාලගුණික තත්ත්වයක් තවදුරටත් වර්ධනය කරනවා. එමගින් ජල මූලාශ්‍ර සිඳී යාමත්, මිනිසාට ජල හිඟයකට මුහුණ දීමටත් ඉදිරියේදී සිදුවෙනවා.

ශාකවල ආහාර නිෂ්පාදන ක්‍රියාවලිය හෙවත් ප්‍රභාසංශ්ලේෂණයේදී වායු ගෝලයෙහි ඇති කාබන් ඩයොක්සයිඩ් වායුව ශාක මගින් උරා ගනු ලබන අතර ඔක්සිජන් වායුව පරිසරයට මුදා හරියි. කාබන් ඩයොක්සයිඩ් වායුව හරිතාගාර වායුවක් ලෙස හඳුන්වන අතර ගෝලීය උෂ්ණත්වය වැඩි කිරීමට ද හරිතාගාර ආචරණය (ගෝලීය උණුසුම - (Global Warming) සඳහා ද දායක වෙනවා. ගිනි තැබීම් නිසා වනාන්තර විනාශය මගින්, ශාක ගණත්වය අඩු වන බැවින් ද, කාබන් ඩයොක්සයිඩ් වායුව අවශෝෂණ මට්ටම අඩුවන බැවින් ද කාබන් ඩයොක්සයිඩ් වායුව ගෝලීය උණුසුම ඉහළ දැමීම සඳහා දායක වෙයි.


පස නිසරු වීම, පසේ පෝෂණ මට්ටමේ වෙනස් වීම, පාංශු ඛාදනය, පසෙහි වායුගෝලයට මුදහරින ඇමෝනියා වැනි අහිතකර වායුන්ගේ සාන්ද්‍රණය ඉහළ යාම සහ දේශගුණික විපර්යාස සඳහා ද වනාන්තර ගිනි තැබීම මග පාදයි. කැලෑ ගිනි තැබීමේදී නිකුත්වන අධික දුමාරය විශාල ප්‍රදේශයකට පැතිරෙන බැවින් වායු දූෂණය ද සිදුවේ.

ශ්‍රී ලංකාව ජෛව විවිධත්වය අනූන රටක් වන අතර ගිනි තැබීම් මගින් ජෛව විවිධත්වය හායනයට ලක්වන අතර ශාක හා සත්ව ප්‍රජාව බලපෑමට ලක් වෙනවා. මෙහිදී ශාක භක්ෂක ජීවීන් වන අලින්, ගෝනුන්, මුවන් වැනි සතුන්ට තම ආහාර හිඟ වේ. පාරිසරික තත්ත්වයන්ගේ සිදුවන වෙනස්වීම් සඳහා අනුවර්තන වීමට නොහැකි සියුම් පටල ශරීරවලින් යුත්, උභය ජීවීන්, උරගයින්, සමනලයින් වැනි පරිසරය අලංකාර කරන මිනිසාට මානසික වින්දනයක් ලබා දෙන ජීවීන් විනාශ වී යනවා.

ශාක විශේෂයන් සලකන කල, සමහර කාෂ්ඨීය ශාක ගිනි ගැනීම් සඳහා යම් ඔරොත්තු දීමක් සිදු කළ ද, අනෙකුත් කාෂ්ඨීය ශාක වන ලයිකන, පාසි වර්ග, පර්ණාංග, ශාක ආශ්‍රිතව ජීවත්වන ඇල්ගී විශේෂ මුළුමනින්ම විනාශයට පත් වෙනවා. කාෂ්ඨීය ශාකවල පවා වර්ධනය බාල වෙනවා.

මිනිසා විසින් තැකීමට ලක් නොවන නමුත් ජෛව විවිධත්වයෙන් අනූන ජීවී කණ්ඩායමක් ලෙස ක්ෂුද්‍ර ජීවීන් විශේෂ හඳුන්වා දිය හැකි අතර ඔවුන් පසෙහි, ශාක තුළ, වායුගෝලයෙහි, ජලයෙහි ආදී වශයෙන් වූ සෑම ස්ථානයකම ජීවත් වෙනවා. ගිනි තැබීම් මගින් ක්ෂුද්‍ර ජීවීන් සඳහා වන විනාශය ගණනය කළ නොහැකියි. ක්ෂුද්‍ර ජීවීන් පරිසරයේ සිදුවන ජීව ක්‍රියාවලිවල සමතුලිත භාවය රැක ගැනීම සඳහා මහඟු දායකත්වයක් දක්වනවා. පස සංරක්ෂණය, පාංශු පෝෂක නිෂ්පාදනය, ජීවීන් අතර රසායනික පණිවිඩ හුවමාරුව (Chemical Communication) සඳහා ද ඔවුන් දායක වෙනවා. ක්ෂුද්‍ර ජීවීන් විනාශ වීම මගින් පරිසරයේ සමතුලිතතාව බිඳවැටීම සිදුවෙනවා. එය අනෙකුත් සියලුම ශාක සහ සතුන්, මිනිසා සඳහා ද අද අහිතකර බලපෑම් එල්ල කරනවා.





ආචාර්ය දර්ශනී සිංහලගේ

කැලෑ ගිනි තැබීම් බොහෝ ජීවීන්ගේ ස්වභාවික වාසස්ථාන විනාශ කරනවා. ඔවුන්ගේ ප්‍රජනන ක්‍රියාවලිය සහ නව ජනිතයින් බිහිකිරීම අඩපණ කරනවා, එනිසා වනාන්තර විනාසය සෘජුවම ජෛව විවිධත්වය හායනයට දායක වේ. ආක්‍රමණකාරී විශේෂ පැතිරීමට ද මෙය බලපානවා. උදාහරණ ලෙස ගිනි තණ පෙන්වා දිය හැකියි. සමහර ශාක විශේෂවල පිහිටි බීජවලවල සුප්තතාවය (Dormancy) බිඳ හෙළීම සඳහා ගිනි තැබීම් දායක වෙනවා. නමුත් මෙය ක්‍රමවත් ආකාරයෙන් සිදුකළ යුතු කරුණකි.

**ගිනි තැබීම් මගින් ජෛව විවිධත්වයට හානි වන අතර ශාක හා සත්ව ප්‍රජාව බලපෑමට ලක්වෙයි. ශාක භක්ෂක ජීවීන් වන අලින්, ගෝනුන්, මුවන් වැනි සතුන්ට තම ආහාර හිඟ වෙයි. උභය ජීවීන්, උරගයන්, සමනලයන් වැනි පරිසරය අලංකාර කරන මිනිසාට මානසික වින්දනයක් ලබා දෙන ජීවීන් විනාශ වෙයි.**

කැලෑ තැබීම යනු වරදක්. කැලෑ ගිනි තැබීම යන වරදට මෙරට නීති 2009 අංක 65 දරන සංශෝධන කැලෑ සංශෝධන පනත ප්‍රකාරව දැඩි දඬුවම් නියම කර තියෙනවා. මෙම දඬුවම් පිළිබඳව මහජනතාව දැනුවත් නොවීම සහ නීති ප්‍රකාරව වරදකරුවන්ට ක්‍රියාත්මක නොවීම, වරදකරුවන් නීතිය හමුවට අසු නොවීම හසුකර ගැනීමට සහ නීතියෙන් ලිස්සා යාමත් වන විනාශය සහ ගිනි තැබීම් තවදුරටත් වර්ධනය වීමට බලපා තිබෙනනවා. වනාන්තර ගිනි තබන්නන්ගේ ඒ සඳහා හේතු පාදක වූ කරුණු සොයා බලා ඔවුන්ගේ අවශ්‍යතා සපයා දීම මගින් මෙම විනාශයන් පාලනය කළ හැකිය.

ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය, එහි අගය සහ ජෛව විවිධත්වය සහ වනාන්තර මගින් මිනිසාට ඇති කරන හිතකර බලපෑම් සහ ප්‍රයෝජන පිළිබඳව මහජනතාව දැනුවත් කළ යුතුයි. මෙය ළමා මනසට ඇතුළත් කළ යුතු කරුණක් වන අතර පරිසරයේ වැදගත්කම පිළිබඳව අත්දැකීම් ලබා දීම පෙර පාසල මට්ටමින් සිටම ආරම්භ කළ හැකියි. පෙර පාසල් ගුරුවරුන් සහ පාසල් ගුරුවරුන් දැනුම්වත් කිරීම් සිදු කළ යුතුයි.

ජෛව විවිධත්වය ආශ්‍රිත කරුණු විෂය මාලාවට ඇතුළත් කර ඇති නමුත් ක්ෂේත්‍ර චාරිකා සහ ප්‍රායෝගික අධ්‍යයන ක්‍රම මගින් මෙම දැනුම සිසු සිසුවියන් තුළ ස්ථාපිත කළ යුතුයි. පාසල් මට්ටමේ සහ සමාජ මට්ටමේ පරිසර සංවිධාන පැවැතීම පැසසුමට කරුණක්. නමුත් මේවායේ ක්‍රියාකාරීත්වය තව දුරටත් වර්ධනය විය යුතුයි. සංරක්ෂණ කලාප ලෙස තවමත් හඳුනාගෙන නොමැති නමුත්, මිනිස් බලපෑමට සෘජුවම දායක වන නමුත් ජෛව විවිධත්වයෙන් අනූන පරිසර පද්ධති හඳුනාගෙන එම ස්ථාන සඳහා සංරක්ෂණ ක්‍රියාමාර්ග දියත් කළ යුතුයි.

රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන මැදිහත්වී විනාශයට පත්වූ වනාන්තර ප්‍රතිස්ථාපනය (Restoration) කිරීමට වහාම ආරම්භ කළ යුතුයි. එසේම විද්වත් උපදෙස් මත ක්‍රමවත් (විධිමත්) ප්‍රතිස්ථාපන මගින් හානි වූ වන වැස්ම වසර කීපයක් තුළ නැවත උපදවා ගැනීමට හැකියාව පවතී.



සටහන හා ඡායාරූප
කුණ්ඩසාලේ
පී.එම්. රාජපක්ෂ

# මහනුවර දියුණුවට ව්‍යාපෘති 7,137ක්

## වියදම රුපියල් කෝටි 664ක්

(කුණ්ඩසාලේ - පී.එම්. රාජපක්ෂ)

**අය වැයෙන් - වැඩ ලක්ෂයක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ පළමු සතිය තුළ මහනුවර දිස්ත්‍රික්කයේ සංවර්ධන ව්‍යාපෘති 7137ක් ආරම්භ කළ බව දිස්ත්‍රික් ලේකම් චන්දන තෙන්නකෝන් මහතා පවසයි.**

මහනුවර දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 6,640ක මුදලක් මුදල් අමාත්‍යාංශය විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා වෙන් කර ඇතැයි ද ඒ මහතා පැවසීය.

අය වැයෙන් - වැඩ ලක්ෂයක් ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ මහනුවර වටපුළුව ප්‍රදේශයේ කෘෂිකාර්මික යටිතල පහසුකම් සංවර්ධනය නිමිත්තෙන් පැවැති උත්සවයකට සහභාගීවෙමින් ඒ මහතා මේ බව ප්‍රකාශ කළේය.

ඊට සමගාමීව රුක් රෝපණ වැඩසටහනක් ද එම පරිශ්‍රයේ සිදුවිය.

රුපියල් මිලියන 1,641ක වියදමින් මහනුවර දිස්ත්‍රික්කයේ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති 2,731ක් ක්‍රියාත්මක වන බව කී ඒ මහතා ජීවනෝපාය සංවර්ධනය වෙනුවෙන් රුපියල් මිලියන 1,092ක වියදමින් ව්‍යාපෘති 2,631ක් ක්‍රියාත්මක වන බවද කීවේය.

සමාජ සුබසාධනය වෙනුවෙන් ව්‍යාපෘති 1,183ක් ක්‍රියාත්මක වන අතර ඒ සඳහා රුපියල් මිලියන 1,851ක් වෙන් කර ඇතැයි ද ඒ මහතා කීවේය. මෙම ව්‍යාපෘති යටතේ පරිසර සංරක්ෂණ ව්‍යාපෘති ද ක්‍රියාත්මක කරන බව කී දිස්ත්‍රික් ලේකම්වරයා, මෙවර මහනුවර දිස්ත්‍රික්කයේ රුපියල් මිලියන 160ක වියදමින් පරිසර ව්‍යාපෘති 592ක් ආරම්භ කොට ඇතැයි ද ප්‍රකාශ කළේය.

මෙ ව්‍යාපෘති සියල්ල ව්‍යාපෘති නිම කිරීමක් බවට පත් නොකර සෑම විටම මහජන ප්‍රතිලාභ අපේක්ෂාවෙන් සිදුවිය යුතු යැයි ද දිස්ත්‍රික් ලේකම්වරයා සඳහන් කළේය.

සියලු ව්‍යාපෘති තුළින් මහජනයාගේ ආර්ථික, ජීවන හා සමාජ මට්ටම යම් අයුරකින් හෝ ඉහළ නැංවීමට අපේක්ෂා කළ යුතු බවත් ඒ වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන්ගේ සක්‍රිය දායකත්වය අපේක්ෂා කරන බවත් දිස්ත්‍රික් ලේකම් චන්දන තෙන්නකෝන් මහතා වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

මහනුවර කඩවත් සතර සහ ගඟවට කෝරළය ප්‍රාදේශීය ලේකම් සම්පත් බණ්ඩාර ජයසිංහ මහතා ඇතුළු පිරිසක් මේ අවස්ථාවට එක්වූහ.


# වසර 170 කට වඩා පරණ සංගිලි පාලම නටබුන්

(හාරිස්පත්තුවේ
මොහොමඩ් ආසික්)

**ඉංග්‍රීසි පාලන සමයේ මෙයට වසර 170 කට පමණ පෙර මහනුවර නගරයත් දුම්බර මිටියාවතත් යා කරමින් මහවැලි ගඟ හරහා ඉදිකරනු ලැබූ ලේවැල්ල සංගිලි පාලම වෙනුවට නව පාලමක් 1993 දී ඉදිකිරීමත් සමඟ කෞතුක වටිනාකමකින් යුත් ඒ සංගිලි පාලම නටබුන් බවට පත් වෙමින් විනාශ කරා ගමන් කරමින තිබෙන බව ප්‍රදේශයේ ජනතාව කියති.**

වසර සීයකට වඩා පැරණි නිර්මාණ කෞතුක වස්තූන් ගණයට ගැණෙන අතර ඒවා පුරා විද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කරයි. එසේ වුවද මහනුවරත් දුම්බර මිටියාවතත් යා කරමින් වසර 170 කට පමණ පෙර ඉංග්‍රීසි පාලන සමයේ ඉදිකරනු ලැබූ ලේවැල්ල පාලම වෙනුවට 1993 වසරේදී නව පාලමක් ඉදි කිරීමත් සමඟ මෙම ඓතිහාසික පාලම අත හැර දමා ඇති අතර මේ වන විට එහි කම්බි ද දිරාපත් වෙමින් නටබුන් බවට පත් වෙමින් තිබේ. ප්‍රදේශවාසීන් පෙන්වා දෙන්නේ ඉංග්‍රීසි යුගයේ වෙනත් ස්ථානවල ඉදි කරනු ලැබූ සංගිලි පාලම් සහ යකඩ පාලම් වෙනුවට නව පාලම් ඉදි කර තිබුණද එම පැරණි පාලම් පුරාවිද්‍යා දේපළක් වශයෙන් සංරක්ෂණය කළත් මෙම සංගිලි පාලම එලෙස නොකර විනාශ වන්නට ඉඩ හැර ඇති බවයි. ඔවුන් ඉල්ලා සිටින්නේ කෞතුක වස්තුවක් වන මෙම සංගිලි පාලම සංරක්ෂණය කර ආරක්ෂා කරගන්නට වගකිව යුතු අංශ පියවර ගත යුතු බවයි.

ඉංග්‍රීසින් කන්ද උඩරට පාලනය තමන් යටතට පත් කර ගන්නා අවස්ථාවේදී කන්ද උඩරට ජනතාව මහවැලි ගඟෙන් එගොඩවීම සඳහා ඔරු සහ පාරු භාවිතා කළ නමුත් ඉංග්‍රීසින්ට අවශ්‍ය භාණ්ඩ ප්‍රවාහනය එමගින් අපහසු වූ බැවින් මහවැලි ගඟ හරහා මෙවන් පාලම් ඉදි කළ බව කියවෙයි. කෙසේ නමුත් මෙලෙස ඉදිකරනු ලැබූ සංගිලි පාලම් සහ යකඩ පාලම් මෙරට ප්‍රවාහන ක්ෂේත්‍රයේ දියුණුවේ සන්ධිස්ථානයක් බවද කියවෙයි. එලෙස මුල් කාලයේ පේරාදෙණිය සහ ගන්නෝරුව යා කරමින් ඉදි කරනු ලැබූ පාලමට සමකාලීනව මෙම පාලමද ඉදි කරනු ලැබ ඇති අතර 1993 වන තුරු ගම්මාන රැසක ජනතාව මහවැලි ගඟ තරණය කිරීම සඳහා භාවිතා කරනු ලැබ ඇත්තේ මෙම සංගිලි පාලමයි. කෙසේ නමුත් 1993 වසරේදී මෙම ස්ථානයේ නව පාලමක් ඉදි කිරීමත් සමඟ මෙම සංගිලි පාලම අත හැර දමා ඇති අතර කෞතුක වස්තුවක් වුවත් මේ වන විට එහි කම්බි දිරාපත් වී විනාශ වෙමින් පවතින අයුරු දක්නට ලැබේ. ප්‍රදේශවාසීන් ඉල්ලා සිටින්නේ මෙම වටිනා සංගිලි පාලම සංරක්ෂණය කර දෙන ලෙසයි.



## නිවැරැදි කිරීමයි



ටියුෂන් ඔඩුදිවීමෙන් පාසල් දරු දැරියන්ට මානසික ආතතිය මැයෙන් පසුගිය ඉරිදා මැදුරට අතිරේකයේ පළවූ වෛද්‍ය චමින්ද වීරසිරිවර්ධන මහතාගේ අදහස් දැක්වීමකට අදාළ ප්‍රවෘත්තියේ ඒ මහතාගේ වෘත්තිය නාමය මනෝ විශේෂඥ ලෙස සඳහන් වූයේ වැරදීමකිනි. එය ජ්‍යෙෂ්ඨ මනෝ උපදේශක, මනෝ චිකිත්සක වෛද්‍ය චමින්ද වීරසිරිවර්ධන ලෙස නිවැරදි විය යුතුය.

# ආබාධිතයන්ට නොසලකන රටක්

ශාරීරික හා මානසික ආබාධ සහිත පුද්ගල සංඛ්‍යාව දිනෙන් දින වර්ධනය වෙමින් තිබේ. ලොව බිලියනක පමණ පිරිසක් මෙම තත්ත්වයෙන් පසුවන බව ලෝක සෞඛ්‍යය සංවිධාන දත්ත පෙන්වා දෙයි. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2012 වසරේ දී සිදුකළ අවසන් සංගණන වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ දහසය ලක්ෂ දාහත් දහස් දෙසිය අනූ හතරක් (1617294) ශාරීරික හා මානසික ආබාධ වලින් පෙළෙන බව තහවුරුව තිබේ. මේ අතරින් පූර්ණ කාලීන ආබාධිත පිරිස ලක්ෂ 04 කි. සෞඛ්‍යය අමාත්‍යාංශය වසර 2014 දී ප්‍රකාශ කළේ දැනට 7 % ක් පමණ අගයක පවතින මෙරට ශාරීරික හා මානසික ආබාධ සහිත පුද්ගල සංඛ්‍යාව 2040 වසර වන විට 24.4 % ක් දක්වා ඉහළ යාහැකි බවයි. ඉදිරි වසර 25 කාලය තුළ ශ්‍රීලංකාවේ ආබාධ සහිත පුද්ගල සංඛ්‍යාව දැනට පවතින සංඛ්‍යාව මෙන් තුන් ගුණයකින් ඉහළ යාහැකි බවට මේ ඔස්සේ අනුමාන කළ හැකිය.

ආබාධ සහිත පුද්ගලයින්ගේ හිමිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට 2016 වසරේදී ශ්‍රී ලංකාව අත්සන් තැබූ නමුත් ඔවුන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා වන නිසි වැඩපිළිවෙළක් රට තුළ මෙතෙක් ක්‍රියාත්මක වී නොමැත. රජයේ ඇතැම් චක්‍රලේඛන නමට පමණක් සීමාවී තිබීම නිසා ආබාධ සහිත පුද්ගලයින්ට සමාජය හා මුසු වීමේදී නොයෙක් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුව තිබේ. පාසල, රෝහල, ඡන්ද මධ්‍යස්ථානය, සිනමා ශාලාව, බස්නැවතුම, දුම්රිය පොළ පමණක් නොව පන්සල, පල්ලිය, කෝවිල ආදි ආගමික ස්ථානවලදී පවා අමිහිරි අත්දැකීම් වලට මොවුන් මුහුණ දෙන බව නොරහසකි. සමාජයේ සෙසු පිරිස් බුක්ති විඳින අයිතිවාසිකම් ලැබීමේ හැකියාව ඔවුනට අහිමි වන්නේ ආබාධිත බව හේතුවෙන් නම් එය ප්‍රශ්න කළ යුතු තත්ත්වයකි.

මහනුවර දිස්ත්‍රික්කය සැලකීමේ දී රාජ්‍ය ආයතන 90% ක පමණම ආබාධ සහිත පුද්ගලයින් සඳහා නිසි ප්‍රවේශ

**රජය චක්‍රලේඛවලින් පවා ලබාදී තිබෙන අයිතිවාසිකම් ආබාධ සහිත පුද්ගලයන්ට ලබා දෙන්න සමහර රාජ්‍ය නිලධාරීන් කටයුතු කරන්නේ නැහැ. සමහරු හිතාමතාම ඒක කරනවා**

## අයිතීන් ලබාදීම රජයේ යුතුකමක්; පළාත් සභාවෙන් උපරිම පියවර ගන්නවා

### මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් ගාමිණී රාජරත්න




පාර්ලිමේන්තුවේ සම්මත කරලා 1996 අංක 28 දරන ගැසට් පත්‍රය නිකුත් කර තිබුණත් එය නිසි ලෙස ක්‍රියාත්මක වෙන්නේ නැහැ.

ආබාධ සහිත පුද්ගලයින් වෙනුවෙන් ප්‍රවේශ පහසුකම් ස්ථාපිත කිරීම සඳහා රජය 2006 අංක එක දරන ප්‍රවේශ නියෝගය නිකුත් කළා. අජිත් සී. පෙරේරා නඩුව පදනම් කර ගනිමින් ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක් 2011 දී ලබා දුන්නා. ඒ අනුව 2014 වන විට රජයේ සහ පෞද්ගලික අංශ දෙකේම සියලුම ගොඩනැගිලිවල ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රවේශ පහසුකම් සලසන්න ඕන කියලා අධිකරණය නියෝගයක් ලබාදී තිබෙනවා. ලංකාවේ පළාත් නවයේම පළාත් සභාවල ඉංජිනේරු මහත්වරු හා තාක්ෂණ නිලධාරීන්ට මේ සම්බන්ධව තිබෙන දැනුම පිළිබඳව අපි සමීක්ෂණයක් කළා. කියන්න කනගාටුයි පළාත් සභා දෙකක නිලධාරීන් විතරයි මේක දැනගෙන හිටියේ. රජය නිකුත් කළ ගැසට් පත්‍රය ඒ අය දැකලවත් නැහැ. ඉතිං කොහොමද ඒ අයගේ අනුමැතියෙන් හැදෙන ගොඩනැගිලිවල ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතීන් රැකෙන්නේ.


## ඔවුන්ගේ අයිතීන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කරන්න ඕනෑ

### කොළඹ නීති පීඨයේ මහාචාර්ය ප්‍රතිභා මහානාම



## වසරකින් දෙකකින් නිවැරැදි කරන්න අමාරුයි

### ආණ්ඩුකාර ලලිත් යූ. ගමගේ






ආබාධිත පුද්ගලයින් මුහුණ දෙන ගැටලුවක් සම්බන්ධව. බස් රථවල සීනුව නාද කළාම ඒ අයට ඒක වැදුනද කියලා ඇහෙන්නේ නැති නිසා සමහර අවස්ථාවල නියමිත ස්ථානයේ බැස ගැනීමට පවා නොහැකි වන බව පැවසුවා. සමහර බස්වල බෙල් එක තිබුණට ඒක වැඩ කරන්නේ නැහැ.

මේ වගේ අපි නොහිතන ගැටලු මේ ප්‍රජාවට තිබෙනවා. මේ ගැන යම් සොයා බැලීමක් කර පිළියමක් යෙදීමේ හැකියාව සොයා බලන්න කියලා මධ්‍යම පළාත් ප්‍රවාහන අධිකාරියට දැනුම් දුන්නා. කථන ආබාධ ඇති අයට අදහස් ප්‍රකාශ කිරීමේදී ප්‍රශ්න ඇති වෙනවා. මෙය සැලකිල්ලට ගෙන පළාත් සභාවේ සේවකයින් 1000 කට සංඥා භාෂාව පිළිබඳ පුහුණුවක් ලබාදෙන්න අපි පියවර ගත්තා. රාජ්‍ය අංශයට සංඥා භාෂාව ප්‍රවිශ්ඨ කරන්න ඕන. රජයේ මෙන්ම

**මහනුවර පොලිසියේ කාන්තා කාර්යාංශය තිබෙන්නේ උඩ තට්ටුවක. මහනුවර දුම්රිය ස්ථානයේ ප්‍රවේශ පත්‍ර කවුළුව ළඟට රෝද පුටුවකින් යන්න බැහැ. මහනුවර ජාතික රෝහලේ වැසිකිළිවලට රෝද පුටුවෙන් යන්න පහසුකම් නැහැ. ඊ.එල්. සේනානායක පුස්තකාලයේ වැසිකිළියටත් රෝද පුටුවකින් යන්න බැහැ. නගර සභාව ඇතුළු පළාත් පාලන ආයතනවල අපි වගේ අයට ප්‍රවේශ පහසුකම් නැහැ**

අවශ්‍ය පියවර ගත යුතුයි.

**මධ්‍යම පළාත් ආණ්ඩුකාර නීතිඥ ලලිත් යූ ගමගේ මහතා ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතීන් ලබාදීම සම්බන්ධයෙන් මෙසේ පැවසුවේය.**

තමන්ගේ අයිතීන් පිළිබඳව සියලු දෙනාගේ ඇස යොමු කරවීම සඳහා ආබාධ සහිත පුද්ගල සංවිධාන මගින් 'රෝද පුටු චාරිකා' නමින් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම අගය කළ යුතුයි. මේ අයගේ ප්‍රශ්නවලට නිසි අවධානය යොමු නොවීම නිසා ඔවුන් යම් යම් ගැටලුවලට සමාජයේ දී මුහුණ දෙනවා. ලෝකයේ දියුණු රටවල් ගත්තම සියලු දෙනාට සමාන අයිතිවාසිකම් ලැබෙනවා. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සෑම අයෙකුටම සමාන අයිතිවාසිකම් තිබෙනවා. ඒ අයිතිය සුරක්ෂිත කිරීම රජයේ වගකීමක්. විශේෂයෙන් මධ්‍යම පළාතේ නව ගොඩනැගිලි ඉදිකිරීමේ දී ආබාධ සහිත පුද්ගලයන්ගේ ප්‍රවේශ පහසුකම් ඇතුළු සෙසු පහසුකම් ස්ථාපිත වන සේ ඒවා කරන්න මේ වන විට පියවර ගෙන තිබෙනවා. සැලසුම් අනුමත කිරීමේ දී මේ ගැන විශේෂයෙන්ම සැලකිලිමත් වන ලෙස උපදෙස් ලබාදී තිබෙනවා. සැලසුම් සකස් කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු මාලාවක්ද දක්වා තිබෙනවා. මේක අපිට වසරකින් දෙකකින් නිවැරදි කරන්න අමාරුයි. නමුත් හැකි උපරිමයෙන් ඒ සඳහා අවශ්‍යය කටයුතු කරනවා.

**කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ මහාචාර්ය, හිටපු මානව හිමිකම් කොමසාරිස් ප්‍රතිභා මහානාමහේවා මහතා මෙසේ පැවසුවේය.**





ඇවිද ගන්න බැරි කෙනෙකුට රෝද පුටුවක් දෙනවාට එහා ගිය කාර්යයක් තිබෙනවා. පළාත් සභා, පළාත් පාලන ආයතන, පාසල්, පුස්තකාල, පූජනීය ස්ථානවලින් 95% කම ආබාධ සහිත පුද්ගලයින්ට ප්‍රවේශ මාර්ග නැහැ. සමහර ගොඩනැගිලිවල විදුලි සෝපානය ළඟට යන්න පඩිපෙළ හය හතක් නගින්න ඕන. මහනුවර පොලිසියේ කාන්තා කාර්යාංශය තිබෙන්නේ උඩ තට්ටුවක. මහනුවර දුම්රිය ස්ථානයේ ප්‍රවේශ පත්‍ර කවුළුව ළඟට රෝද පුටුවකින් යන්න බැහැ. මහනුවර ජාතික රෝහලේ වැසිකිළිවලට රෝද පුටුවෙන් යන්න පහසුකම් නැහැ. ඊ.එල්. සේනානායක පුස්තකාලයේ වැසිකිළියටත් රෝද පුටුවකින් යන්න බැහැ. නගර සභාව ඇතුළු පළාත් පාලන ආයතනවල අපි වගේ අයට ප්‍රවේශ පහසුකම් නැහැ. සමහර තැන්වලට ගියාම ගෙදර ඉන්නේ නැතුව ඇයි ආවේ කියලා අහනවා. රෝද පුටුවල යන අය රෝහලක ක්ලිනික් එකකට ගියොත් කැතිටර් එකක් දගෙන යන්නේ. මොකද ටොයිලට් හදලා තිබෙන්නේ ආබාධ සහිත පිරිසක් රටේ ඉන්නවාද කියලවත් හිතන්නේ නැතුවයි.

රජය නිකුත් කළ 1996 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් පනත මගින් ආවරණය කර තිබෙන්නේ රැකියා, අධ්‍යාපන හා ප්‍රවේශ මාර්ග යන කාරණා තුන පමණි. එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් නිකුත් කර තිබෙන ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය මෙරට ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලෙස ආබාධ සහිත පුද්ගල සංවිධාන ඉල්ලා සිටී. ඒ සම්මුතිය 2006 වසරේදී රටක් ලෙස අප පිළිගත් නමුත් එය පාර්ලිමේනතුවේ සම්මත කරනු ලැබුවේ 2016 පෙබරවාරි 08 වැනිදා ය. මෙය තවමත් ඇත්තේ නීතිපති දෙපාර්තමේන්තුවේ ය.

**පළාත් සභාවල ඉංජිනේරු මහත්වරු හා තාක්ෂණ නිලධාරීන්ට මේ සම්බන්ධව තිබෙන දැනුම පිළිබඳව අපි සමීක්ෂණයක් කළා. කියන්න කනගාටුයි පළාත් සභා දෙකක නිලධාරීන් විතරයි මේක දැනගෙන හිටියේ. රජය නිකුත් කළ ගැසට් පත්‍රය ඒ අය දැකලවත් නැහැ. ඉතින් කොහොමද ඒ අයගේ අනුමැතියෙන් හැදෙන ගොඩනැගිලිවල ආබාධ සහිත පුද්ගලයන්ගේ අයිතීන් රැකෙන්නේ.**



පහසුකම් නොමැත. දුම්රිය ස්ථාන, පොලිසි, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, රෝහල් ඇතුළු රාජ්‍ය ආයතනවල මෙන්ම පූජනීය ස්ථානවලද පෞද්ගලික ව්‍යාපාරික ස්ථානවලද මෙම ප්‍රජාව සඳහා ප්‍රමාණවත් ප්‍රවේශ පහසුකම් නොමැත. ඒවා සකස්කර දෙන මෙන් බලධාරීන්ගෙන් කරනු ලබන ඉල්ලීම් බිහිරි අලින්ට වීණා වයන්නා වැනි තත්ත්වයකට පත්ව ඇත.

මේ නිසාම ජාත්‍යන්තර රෝද පුටු දිනය නිමිත්තෙන් මාර්තු 02 වැනි දින රෝද පුටු චාරිකා නමින් වැඩසටහනක් දිස්ත්‍රික් 06 ක එකම අවස්ථාවක දියත් කිරීමට ආබාධ සහිත පුද්ගල සංවිධාන එකමුතුව පියවර ගත්තේය. එහි මහනුවර උත්සවය අයිතීන් උදෙසා අපි සංවිධානය මගින් සංවිධානය කරනු ලැබීය. මධ්‍යම පළාත් ආණ්ඩුකාරවරයා සහ පළාත් ප්‍රධාන ලේකම්වරයා වෙත එහිදී සංදේශයක් මගින් ආබාධ සහිත පුද්ගලයින්ගේ ප්‍රවේශය හා පවතින ගැටලු යොමු කිරීමට රෝද පුටු චාරිකාවට එක්වූ පිරිස පියවර ගත්හ.

**ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් දිනා ගැනීම සඳහා ක්‍රියාකාරීව කටයුතු කරන අයිතීන් උදෙසා අපි සංවිධානයේ සභාපති නිශා ෂරීෆ් මෙනවිය මේ සම්බන්ධව ප්‍රකාශ කළේ මෙවැනි අදහසකි.**

මම උපතින්ම දෙපා අප්‍රාණික කෙනෙක්. ආබාධිත බව නිසාම මට වෙනස් කොට සැලකීම් අත්විඳින්නට සිදුව තිබෙනවා. රජය චක්‍රලේඛනවලින් පවා ලබාදී තිබෙන අයිතිවාසිකම් ආබාධ සහිත පුද්ගලයින්ට ලබා දෙන්න සමහර රාජ්‍ය නිලධාරීන් කටයුතු කරන්නේ නැහැ. සමහරු හිතාමතා ඒක කරනවා. ග්‍රාමීය මට්ටමින් ජීවත්වන ආබාධ සහිත පුද්ගලයන් තමන්ගේ අයිතිවාසිකම් සම්බන්ධව නොදැන සිටීමත් විශාල ප්‍රශ්නයක්. ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනත



**ආබාධ සහිත පුද්ගලයින් පිළිබඳ ජාතික පුහුණු ආයතනයේ සංවර්ධන කළමනාකරු ජීවන් කොඩිතුවක්කු මහතා මෙසේ පැවසුවේය.**

වෙනත් තැනැත්තකුගේ සහයක් නැතුව ප්‍රසිද්ධ ස්ථානයකට හරි පොදු සේවා සපයන ගොඩනැගිල්ලකට හෝ ඇතුළු වෙන්න ආබාධ සහිත පුද්ගලයකුට හැකියාව තියෙන්න ඕන. මහනුවර පාසල් ගත්තොත් 99 % කම මේ අයට ප්‍රවේශ පහසුකම් නැහැ. සමහර තැන්වල ප්‍රවේශ පහසුකම් සකස් කරලා තිබුණත් ඒවයේ ප්‍රමිතියක් නැහැ. ඒවා පාවිච්චි කරන්න බැහැ. සමහර ගොඩනැගිලිවල අල්ලලා තිබෙන්නේ මතුපිට ඔප දැමූ ටයිල්. ඒවා මත කිහිලි කරුවලින් යන අයට තියා කිසිදු ආබාධ තත්ත්වයක් නොමැති අයටත් යන්න අමාරුයි. රජයේ මෙන්ම පෞද්ගලික බැංකු බොහොමයක අල්ලලා තිබෙන්නේ මේ ඔපදැමූ ටයිල්. සමහර තැන්වල රැම්ප් එකේ ආනතිය වැඩියි. තවත් ඒවගේ අත්වැට නැහැ. සමහර ඒවා පළලින් අඩුයි.

**මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් ගාමිණී රාජරත්න මහතා මෙසේ කීවේය.**

ආබාධ සහිත පුද්ගලයන්ගේ ගැටලු පිළිබඳව අපේ විශේෂ අවධානය යොමුව තිබෙනවා. පසුගිය දිනක මෙම සංවිධාන නියෝජිත පිරිසක් මා හමුවීමට පැමිණියා. එතනදී ඔවුන් කිව්වා පොදු ප්‍රවාහන සේවාවල ගමන් කිරීමේ දී ශ්‍රව්‍ය

පෞද්ගලික අංශයට අයත් පොදු ගොඩනැගිලිවල ආබාධ සහිත පුද්ගලයින් සඳහා ප්‍රවේශය තිබිය යුතුයි. අපි ඒක පිළිගන්නවා. මේ අයගේ අයිතීන් ලබාදීම රජයේ යුතුකමක්. මධ්‍යම පළාත් සභාව ලෙස අපි ඒ වෙනුවෙන් අවශ්‍ය උපරිම පියවර ගන්නවා.

**බැරන්ඩිනා ආයතනයේ ව්‍යාපෘති කළමනාකාර අර්ජුන එරමුදුගොල්ල මහතා මෙසේ ප්‍රකාශ කළේය.**

මහනුවර දිස්ත්‍රික්කයේ ස්ථාන 80 ක පමණ දැනට පවතින ප්‍රවේශ පහසුකම් වැඩිදියුණු කිරීමට අපි පියවර ගනිමින් සිටිනවා. මෙතනදී භෞතික ප්‍රවේශය වගේම තොරතුරුවලට ප්‍රවේශවීමේ පහසුකමද මේ අයට ලබාදීම සම්බන්ධව අපේ අවධානය යොමුව තිබෙනවා. මහනුවර දිස්ත්‍රික්කයේ පොදු ගොඩනැගිලිවල ආබාධ සහිත පුද්ගලයන් සඳහා ඇති ප්‍රවේශ පහසුකම් සම්බන්ධ විගණනයක් කළ යුතුව තිබෙනවා.

**මහනුවර දිස්ත්‍රික් සමාජ සේවා නිලධාරී චන්දන කල්පගේ මහතා අදහස් දක්වමින් මෙසේ කීවේය.**

මේ අය සඳහා මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විධිමත් ලෙස ප්‍රවේශ පහසුකම් සකස් කර තිබෙනවා. ආබාධ සහිත පුද්ගලයින් වෙනුවෙන් රථගාලේ වෙනම ස්ථානයක් වෙන් කරන්නත් අපට හැකියාව ලැබුණා. පනතට අනුව පොදු ගොඩනැගිලි ඉදිකිරීමේ දී ආබාධ සහිත අයගේ ප්‍රවේශ පහසුකම් ස්ථාපිත කළ යුතුයි. පෞද්ගලික අංශයටත් මේක වලංගුයි. ඒවායේ හිමිකරුවන් ඒ වෙනුවෙන්



නිශා ෂරීෆ්



ජීවන් කොඩිතුවක්කු

විවිධ ආබාධ සහිතව ජීවත් වුණත් ඒ අය මනුෂ්‍යයෝ කියන එක අපි අමතක කරන්න හොඳ නැහැ. සමාජයේ ඒ අයටත් තිබෙන්නේ අනිත් අයට තිබෙන අයිතිවාසිකම්මයි. සමහරු ආබාධිත වෙලා ඉන්නේ ඒ අයගේ වරදකින් නෙවෙයි. වෛද්‍යවරයකු රියැදුරකු අතින් සිදුවන සුළු අතපසු වීමකින් කෙනෙකු ආබාධිත තත්ත්වයට පත්වෙන්න පුළුවන්. මේ අයගේ අයිතිවාසිකම් සම්බන්ධව රාජ්‍යය ප්‍රතිපත්තියක් දැනට තිබෙනවා. රාජ්‍යය පරිපාලන අමාත්‍යාංශය යටතේ නිකුත් කළ රෙගුලාසිත් තිබෙනවා. තමන්ට අසාධාරණයක් සිදුවූ බව කියා ආබාධ සහිත පුද්ගලයකුට ශ්‍රේෂ්ඨාධිකරණයට හෝ මානව හිමිකම් කොමිසමට යන්න බැහැ. මේකට හේතුව ව්‍යවස්ථාවෙන් මේ අයගේ අයිතීන් මූලික අයිතියක් ලෙස පිළිගෙන නොතිබීමයි. ව්‍යවස්ථාවේ යම් යම් සීමා කිරීම් යටතේ මේ අයිතිවාසිකම් තිබුණත් වැඩක් නැහැ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍යය ප්‍රතිපත්ති හා රාජ්‍යය මෙහෙයවීමේ මූලධර්මවල යුතුකම් කොටසේ මේ ගැන සඳහන් කරලා තිබෙනවා. වර්ගීකරණය කරන්න එපා කියලා තිබුණට යුතුකම් කඩකළා කියලා අදාළ බලධාරීන්ට මුකුත් කරන්න බැහැ. මේ නිසා වඩාත් හොඳ දේ ව්‍යවස්ථාව යටතේම මේක වෙනම සඳහන් කිරීමයි.

සටහන හා ඡායාරූප
සෙංකඩගල
ඉඳුනිල් කහටපිටිය

කොළඹ 2 හුණුපිටිය හරස් පාරේ අංක 8 දරන ස්ථානයේ පිහිටි විජය නිවුස්පේපර්ස් ලිමිටඩ් විසින් 2022 මාර්තු මස 13 වැනිදා ඉරිදා එම ස්ථානයේදී මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී